## අඟහරු ගවේෂණ යාන මෙහෙයුමට ඇපකැපවන

# M - කණ්ඩායම







**රතු ග්‍රහයා හෙවත් අඟහරු ග්‍රහලොව ඉතා ඈත අතීතයේ පටන්ම මිනිස් සිත් සතන් හි කුතුහලය ජනිත කිරීමට සමත් වුවක් ලෙස වඩාත් ප්‍රචලිතය. අඟහරු ග්‍රහලොව තුළ ජීවීන් සිටී යැයි යන මතය මෙම කුතුහලය ඇති කිරීමෙහිලා සමත් වූ ප්‍රබල සාධකයකි. මේ මතය සැක හැර පසක් කර ගැනීමට වරින් වර විවිධ විද්‍යාඥයන් ඇතුළු කණ්ඩායම් දැරූ උත්සාහයන් සුළු පටු නොවේ.**

ඇමරිකානු අභ්‍යවකාශ ආයතනය මගින් මේ සඳහා දියත් කළ නවතම "මාර්ස් එක්ස්ප්ලොරේෂන් රෝවර්ස්" නැමැති මෙහෙයුම දැනට ඉතා සාර්ථකව ප්‍රතිපල දක්වමින් ඇත. මෙහි ප්‍රධාන අරමුණ ද අඟහරු ග්‍රහයා මත ජීවයක් පවතී ද ත්ත දැන ගැනීමයි. මෙම විස්මිත කර්තව්‍යයට උර දෙන විද්‍යාඥයන් ද කිසිසේත් ම අමතක කළ නොහැකි සෙයකි. ඒ අන් කිසිවක් නිසා නොව, මිනිස් මොළයෙන් මෙතෙක් කරන ලද අති විශිෂ්ඨ ගණයේ හාස්කමක් ලෙස මෙම අභ්‍යවකාශ තරණය සැලකෙන බැවිනි.

මේ ඒ සඳහා ඇප කැප වූ විද්‍යාඥයන් සහ ඉංජිනේරුවන් හය දෙනෙකු පිළිබඳ අන්තර්ජාලය තැබූ සටහනකි. මොවුන් කණ්ඩායම නාසාහි එම් - කණ්ඩායම (Nasa' S M - Team)නමින් හඳුන්වනු ලැබේ. ඩෙබොරා බාස්, ජිම් රයිස්, සෝයි ලර්නර්, කෝබ් බොයිකින්ස්, ඇඩම් ස්ටෙල්ට්සර්, සහ ෂොන්ටෙ රයිට් මෙම නාසාහි එම් - කණ්ඩායමේ සාමාජිකයන් ලෙස සැලකේ. බොහෝ කාලයක සිට තම ශ්‍රමය හා කාලය කැප කරමින් කළ මෙම විශිෂ්ඨ හාස්කමෙහි ප්‍රතිඵල නෙළා ගැනීමට මහත් වූ බලාපොරොත්තු වෙන් දෑස් දල්වා සිටින මෙම කන්ඩායමට තවමත් නිශ්චිත ප්‍රතිඵලක් ලබා ගත හැකි වී ඇත.

මේ අතරතුර එම් කම්-කන්ඩායම සිය විද්‍යා ගවේෂණයෙන් මදක් ඈත්ව තම සරල දිවි පෙවෙත් පිළිබඳ මතක සටහන් ද තබමින් සිටිති. කෝබ් බෝයිකින්ස් නාසා ආයතනයේ අභභවකාශ ගමන් කරවීමේ විද්‍යගාරයේ කාර්මික ඉංජිනේරුවරයෙකි. මේ ඔහුගේ අදහසයි

"දිනපතා උදෑසන අවදිවන මම ව්‍යායාම කිරීම සඳහා කාලය යොදවමි. මෙම විද්‍යා ගවේෂණය ඉතා විනෝදජනකය. එයින් මිනිසුන් සමග කතාබහ කිරීමේ අවස්ථාව සැලසේ . එසේම පෘථිවියේ වෙසෙන ඉතා නැණවත් පුද්ගලයන්ට අමතරව ග්‍රහ තාරකාවන් හි වාසය කරන ඉතා ඥනවන්ත මිනිසුන් හමුවීමේ අවස්ථාව උදා වෙනු ඇත."

කොබ් බෝයිකින්ස් හොකී ක්‍රීඩාව ප්‍රි ය කරන්නෙක් වෙයි. කලකට ඉහත ඔහු කැලිෆෝනියා තාක්ෂණික අධ්‍යායන ආයතනයේ ප්‍රධානියෙක් ද විය.

කාර්මික ඉංජිනේරුවරයෙක් ලෙස මෙම මාර්ස් එක්ස්ප්ලොරේෂන් රෝවර මෙහෙයුමේ ඔහුට පැවරී තිබූ ප්‍රධාන කාර්යය වූයේ අඟහරු ගවේෂණ යානයේ උපකරණමය කොටස භාරව සිටීමයි " ස්පිරිට් " යන යානා ද්විත්වයෙහි ම එම කාර්යය ඔහුට පැවරී තිබිණ.

එම් - කණ්ඩායමේ තරුණ විද්‍යාඥයෙක් ලෙස මෙලෙස ඔහුට විශාල කාර්යභාරයක් පැවරී තිබීම සුවිශේෂ කරුණකි.


එම්- කණ්ඩායමෙ සිටින එකම ප්‍රධාන විද්‍යඥයා කොබ් පමණක් නොවේ. සෝයිලර්නර් අඟහරු ගවේෂණ යානා කණඩායමේ එතම් එම් කණ්ඩායමේ තවත් විද්‍යාඥවරියකි. එසේම ඇය කෝර්නල් විශ්ව විද්‍යාලයේ දෙවන වසරේ උපාධි අපේක්ෂිකාවකි. ඇ මෑතකදී ඇමරිකානු අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ ඇතීනා වෙබ් අඩවිය මගින් සතියේ "නිසංසල විද්‍යාඥවරිය " ලෙස නම් කර තිබිණ.

ඇ පාසැල් ශිෂ්‍යාවකව සිටි කාලයෙත් පසු, එසේම විද්‍යාඥවරියක් හෝ අඟහරු පිළිබඳ කියවීම් නොකරන අවදියකදී සෝයි ලර්නර් පාපන්නු කණ්ඩයම් හි ප්‍රබල චරිතයක් ලෙස කැපී පෙනුන අයෙකි. විසිපස් හැවිරිදි විද්‍යාඥවරියක ලෙස ඇය තම හැඟීම් සටහන් කොට ඇත්තේ මෙසේය.

"මෙම ක්ෂේත්‍රයේ නිරත වීම සදහා ඔහු හෝ ඇය සුවිශෙෂී වර්ගයේ පුද්ගල චර්තයක් වීම අවශ්‍ය නොවේ".

ඇගේ විග්‍රහයට අනුව විද්‍යව හෝ ග්‍රහලෝක විද්‍යා ගවේෂණය සෑම පුද්ගලයෙක් සඳහා ම වූ විෂය ක්ෂේත්‍රකි. එය කිසිවිටෙකත් මොළකාරයින් සඳහා පමණක් වෙන් වූවක් නොවේ .

ඇඩම් ස්ටෙල්ට්සර් එම් කණ්ඩායමේ තවත් සුවිශේෂී විද්‍යාඥයෙකි. අඟහරු ගවේෂණ යානා අඟහරු වෙත ළඟාවීමේ දී කක්ෂගතවන ඉතා දුෂ්කර අවස්ථාවේ එහි නියමුවා වන්නේ ඇඩම් ස්ටෙල්සර්ය. එසේම යානය පෘථිවිය මත ගොඩ බැස්සවීමේ දී ද ඔහු එහි ප්‍රධානියාය. විස්කන්සින් විශ්වවිද්‍යාලයේ සම්මානලාභී ගුරුවරයෙක් වන මොහු සංගීතය කෙරෙහි දක්වනුයේ ද මහත් කැමැත්තකි . එසේම ඇමරි-



එම්- කණ්ඩායමෙ සිටින එකම ප්‍රධාන විද්‍යඥයා කොබ් පමණක් නොවේ. සෝයිලර්නර් අඟහරු ගවේෂණ යානා කණඩායමේ එතම් එම් කණ්ඩායමේ තවත් විද්‍යාඥවරියකි. එසේම ඇය කෝර්නල් විශ්ව විද්‍යාලයේ දෙවන වසරේ උපාධි අපේක්ෂිකාවකි. ඇ මෑතකදී ඇමරිකානු අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ ඇතීනා වෙබ් අඩවිය මගින් සතියේ "නිසංසල විද්‍යාඥවරිය" ලෙස නම් කර තිබිණ.

කානු අභ්‍යාවකාශ මධ්‍යස්ථානයේ රැඳෙමින් ඔහු කරන ඔහුගේ රැකියාවට ඔහු තුළ ඇත්තේ සුවිශේෂී ලැදි කමකි.

ඇත්තෙන් ම මෙම අඟහරු ගවේෂණය මගේ ජීවිතයේ මග සලකුණු අතරෙන් කැපී පෙනෙන මංසන්ධියකි. එසේම මෙය ඇදහිය නොහැකි වූ විශ්මයජනක අත්දැකීමකි.

ඇමරිකානු අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ සේවය කරන සියළු දෙනා තම රැකියාවෙන් උපරි ම තෘප්තියක් ලබන බව පැහැදිලිව පෙනෙන කරුණකි. එම්- කණ්ඩායමේ විද්‍යාඥයන් තම සේවා කාර්යය කෙරෙහි දක්වනුයේ අසීමිත ආදරයකි

"මගේ රැකියාව ඉතා නිහඬතාවකින් යුතු වූවකි . මම කැමති තවත් එවන් වූ ද නම් කිරීමට මම නෙදනිම් " පොන්වේ රයිට් එලෙස පවසන්නීය. ඇය අඟහරු ගවේෂණ යානා මෙහෙයුමේ තාප පද්ධතියෙහි ඉංජිනේරුවරියකි.

ලොව මවිත කරවීමෙහි මහත් වූ ව්‍යාපෘතියකට තමන් ද දයක වෙමින් සිටිද්දී තමන්ගේ සිතුවිලි කෙසේ වේද ?"

"ඉංජිනේරුවරයෙකු හෝ විද්‍යාඥයෙකු යනු සැහැල්ලු මනසක් ඇති අයෙක්." ඒ ඇයගේ අදහස ය.

ෂොන්ටෙ සංගීතයට මහත් ආදරය කරන්නියකි. බාස්කට් බෝල් ක්‍රීඩාවට ඇය තුළ ඇත්තේ ද අප්‍රමාණ කැමැත්තකි. එසේම ඇය සතියකට පැය නවයක් කාල්ටෙක් ව්‍යායාම මධ්‍යස්ථානයේ ගත කිරීමට ද අමතක නොකරන්නීය.

එම් - කණ්ඩායමේ සාමාජිකයන්ගේ විවිධ වර්ගයේ වූ විනෝදංශ අතරින් ක්‍රීඩාවට සුවිශේෂී ස්ථානයක් හිමිව තිබේ. ඩෙබොරා බාස් මෙම අඟහරු ගවේෂණ නියෝජ්‍ය විද්‍යා කණ්ඩායමේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. ඇය කැම පිසීමට මහත් කැමැත්තක් දක්වන්නීය. තම සැමියා සහ ජර්මන් ෂෙපර්ඩ් වර්ගයේ සුරතල් බල්ලා වන හාලී සමඟ හැංගිමුත්තං සෙල්ලම් කිරීමට ද ඇය ප්‍රිය කරයි. ඇය ඇයගේ ජීවිතය සතුටින් තබා ගැනීමට මහත් උත්තඳුවක් දක්වන අතර ඇයගේ සියළු ක්‍රියාකාරකම් තුළින් සතුටක් ලබා ගැනිමට ඇය වග බලා ගන්නීය.

"එක් ආකාරයකින් අපි ගිනි නිවන භටයන් හා සමානය. සෑම දිනෙකම ඇතිවන විවිධ ගැටළු විසඳලීම අපගේ කාර්යයි. කුතුහලයෙන් පිරී ගිය මෙවැනි ගැටළු ක්ෂණිකව නිවා දැමීමට අප ක්‍රියා කළ යුතුයි."

ජීම් රයිස් එම් - කණ්ඩායමේ තවත් විද්‍යාඥයෙකි. ඔහුගේ ළමා වියෙහි පටන් තිබූ සිහිනය වූයේ අභ්‍යවකාශ ගවේෂණ ජය ගැනීමට දයක වීමයි. ඔහු වයසින් වැඩෙත් ම ගණනය කළ නොහැකි තරම් වූ රොකට් යානාවක් සහ ගගණගාමීන් පිළිබඳ ලිපි ලියන්නට විය. ඔහුගේම දුරදක්නයෙන් සොයාගත් කරුණු ඒවායේ අන්තර්ගත වී තිබිණී. ඒ අතර ඔහු අභ්‍යවකාශ ගවේෂණය පිළිබඳ බොහෝ කරුණු සොයා යමින් ඒවා කියවන්නටත් විය.

ජීම්ගේ දෙමව්පියන් ඔහුගේ මෙම ළමා වියෙහි පටන් වූ සිහිනය සැබෑ කර ගන්නට බොහෝ උදව් උපකාර කළහ. ඇතැම් අවස්ථාවලදී ඒවා ඒ ආකාරයෙන් ඉෂ්ඨ නොවුන ද ඔවුහු උත්සාහය අත් නොහළහ. එසේම ඔහුගේ සමකාලීන ශිෂ්‍යයන් ඔහුට ඇතැම් විහිළු නම් පට බැඳ තිබිණ. ඒවා කෙරෙහි පවා සැළකිල්ලක් නොදැක්වූ ඔහු තම අභිමතාර්ථයන් ඉටු කර ගනු වස් ක්‍රියා කළේය. එම නොපසුබට උත්සාහය ඔහුට වාසනාව රැගෙන ආවේය.

වර්තමානයේ ජීම් රයිස් ඇරිසෝනා ප්‍රාන්ත විශ්වවිද්‍යාලයේ සවිකර ඇති අඟහරු ගවේෂණ යානාවක් හි තාප විමෝචක ප්‍රතිබිම්බමාන කැමරා සම්බන්ධ කොටසේ වැඩ කරමින් සිටියි.

"ලෝකයේ තිබෙන රැකියාවන්ගෙන් හොඳම රැකියාවක් මට ලැබී ඇති සෙයක් මට දැනේ. එසේම එය ගෞරවනීය වූවකි. සියළු සිහිනයන් සැබෑ වේවා."

ඒ ජීම් රයිස් තම හැඟීම් වචනයට පෙරළු අයුරුය. ❑

WWW NASA . Gov

ඇසුරෙනි

**සමන්මලී ජයකොඩි**